ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව -2018**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

සුදුසුකම් : අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයන් හයක් සම්මාන තුනක් සහිතව සමත්වීම හෝ එයට සමාන විභාගයකින් සම්මාන තුනක් සහිතව සමත්වීම අවම සුදුසුකම වේ.

මාධ්‍යය: සිංහල

පාඨමාලා ගාස්තු: 20000 කි.

කාලය : එක් අවුරුදු පාඨමාලාවකි.

දේශන: සෙනසුරාදා දිනවල පෙ. ව. 8. 00 සිට ප. ව 4. 00 දක්වා පැවැත්වේ.

අධ්‍යයන චාරිකාව: තායිලන්ත, සිංගප්පූරුව හෝ මැලේසියා රටවලින් එකකට අධ්‍යයන චාරිකාවක්.

අයදුම් කරන පිළිවෙළ : අයදුම්පත්‍ර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයට සතියේ දිනවල පැමිණ හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

**පාඨමාලා සමායෝජක, බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.** ලිපිනයට රු. 15 ක මුද්දර ඇලවූ (ඔබගේ ලිපිනය ලියන ලද) ලියුම් කවරයක් එවීමෙන් ද අයදුම් පත්‍ර ලබාගත හැකිය.

(මෙම පාඨමාලාව සමත්වීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධිය සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් වේ.)

සැ. කි. : රු. 350ක අයදුම් පත්‍ර ගාස්තුව මහජන බැංකුවේ 013010001314 ගිණුම් අංකයට බැර කොට අදාළ රිසිට් පත, සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017. 12. 30 වන අතර වැඩි විස්තර 0714149688 දුරකථන අංකයට ඇමතීමෙන් ලබාගත හැකිය.

ලේඛකාධිකාරී,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.